# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2206/10 - 2020 දෙසැම්බර් මස 16 වැනි බදාදා - 2020.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2020 සැප්තැම්බර් මස 30 දිනැති අංක 2195/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ අංක 2501.00 යටතට වැටෙන ලුණු (Sodium Chloride B.P.) ආනයනය සඳහා අදළ වන කිලෝග්‍රෑමයකට රු. 40ක් වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයකට රු. 10ක් අයකරගෙන ඉතිරි වටිනාකම, ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යටතේ ලියාපදිංචි වානිජ පර්මාර්ථයෙන් තොරව ඖෂධ නිෂ්පාදනය කරන ඕනෑම ඖෂධ නිෂ්පාදන ආයතනයක් සඳහා අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය 2021 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වලංගුව පැවතිය යුතුය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

01 - 89

1A - PG 5178 — 570 (2020/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*